**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

**මුදල් අමාත්‍යාංශය**

**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுமைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No ..DSD/HO/6/EP/2/FB.. | ඔබේ අංකය<br>உமது இல<br>Your No .................... | දිනය<br>திகதி<br>Date ..2020.08.27.. |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

**සමෘද්ධි ව්‍යවසායකයින් වෙනුවෙන් මුහුණු පොතේ සමූහයක් නිර්මාණය කිරීම**

**Samurdhi Business Directory – Facebook Group**

සමෘද්ධි වැඩසටහනේ ප්‍රතිලාභ ලබා සෘජුවම තම ව්‍යාපාර කටයුතු වල යෙදෙන ව්‍යවසායකයින් වර්ථමාන තරඟකාරි වෙළඳපලතුල හුදකලා විම නිසා විවිධ ගැටළු රාශියකට මුහුණපා ඇත. එබැවින් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2020 යටතේ සුළු පරිමාණ ව්‍යාපාරිකයින් වන ඔවුන් වෙනුවෙන් සමාජ මාධ්‍ය ජාල තුල වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබා දිමට සැලසුම්කර ඇත. එමගින්,

- දිවයින පුරා විසිරි සිටින සමෘද්ධි ව්‍යවයකයින් එකම වෙලඳපලකට ගෙන ඒම.
- ඔවුනොවුන් අතර අන්‍යෝන්‍ය හඳුනාගැනිමට අවස්ථාව සැලසීම.
- නව පාරිභෝගික ජාලයක් හඳුනාගැනිමට අවස්ථාව සලසා දීම.
- වෙළඳපල තොරතුරු හුවමාරුව.
- නව වෙළඳපල දැණුම හා තාක්ෂනය හුවමාරුව.
- දේශිය වෙළඳපල මෙන්ම ජාත්‍යන්තර වෙළඳපල දක්වා පුළුල් කිරිම.
- අන්තර්ජාලය තුලින් භාණ්ඩ වෙළඳාම හා ඒ තුලින් ලැබෙන වාසි අත්කර දිම.

අපේක්ෂා කෙරේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |

2. මේ අනුව "Samurdhi Business Directory" නමින් මුහුණු පොතේ සමූහයක් (A Facebook Group) නිර්මාණය කර ඇති අතර එහි පරිපාලක (Administrator) ලෙස ව්‍යවසාය සංවර්ධන අංශය කටයුතු කරනු ඇත.

3. දිවයින පුරා විසිරි සිටින සමෘද්ධි ව්‍යවසායකයින්හට තම නිෂ්පාන හා සේවා සඳහා වෙළඳ දැන්වීම් ***පොස්ටු (posts), ඡායාරූප, වීඩියෝ ලෙස සිංහල, දෙමල හෝ ඉංග්‍රීසි*** යන ඕනෑම භාෂාවකින් යොමු කල හැකි අතර පරිශීලනය කරන්නන්නට හඳුනාගැනිමේ පහසුව සඳහා එක් එක් නිෂ්පාපාදන වර්ගීකරනයන් තුල පෙල ගස්වනු ඇත. එසේම ලෝකයේ සිටින ඕනෑම අයෙකුට තම භාණ්ඩ හා සේවා අවශ්‍යතාවයන් ද විමසීම් කළ හැක. යොමු කරනසෑම වෙළඳ දැන්විමක් තුලම ,

- ➢ ව්‍යාපාර නාමය
- ➢ සම්බන්ධ කරගත හැකි දුරකථන අංකයක්
- ➢ ව්‍යාපාරය / ව්‍යාපාර පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය

සඳහන් විම වැදගත් වනු ඇත.

4. කිසියම් ව්‍යවසායකයකු වෙත **මුහුණු පොතේ** ගිණුමක්(Face book account) නොමැතිනම් නව ගිණුමක් ඔහු හෝ පවුලේ අයෙකු නමින් විවෘත කරන ලෙස නිලධාරින් මගින් දැණුවත් කිරිමට කටයුතු කරන්න. එසේත් නොමැති අය සඳහා දැනට ප්‍රාදේශී ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වාගෙන යනු ලබන **මුහුණු පොතේ** ගිණුම් මගින් හෝ වෙනත් ඕනෑම අයෙකුගේ පුද්ගලික ගිණුමක් පරිශීලනය මගින් හෝ මේ සඳහා අවස්ථාව සලසා දිය හැක.

ඔබ දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි නිලධාරින් මේ පිළිබඳව දැණුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ආනන්ද ගමගේ
සහකාර අධ්‍යක්ෂ(ව්‍යවසාය සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට